B කොටස.

**<u>රචනා.</u>**

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න. කාලය- පැය 02.

01). "කාලගුණික දත්ත ලබා ගැනීමේදී ස්වයංක්‍රීය කාලගුණික මධ්‍යස්ථානය, සම්ප්‍රදායික කාලගුණික මධ්‍යස්ථානයකට වඩා කාර්යක්ෂම වේ."

a. ඉහත ප්‍රකාශය සත්‍ය ද? අසත්‍ය ද? ඔබේ පිළිතුර නිදසුන් සහිතව විස්තර කරන්න. (ල.30)

b. පසෙහි pH අගය කෙරෙහි වර්ෂාපතනයේ බලපෑම විස්තර කරන්න. (ල.30)

c. පස් කාණ්ඩ පිළිබඳ අධ්‍යයනයෙහි වැදගත්කම පහදන්න. (ල.30)

02). a. ජල දූෂණය අවම කිරීමට පාසල් ශිෂ්‍යයෙකු ලෙස ඔබට ගත හැකි ක්‍රියාමාර්ග පහක් විස්තර කරන්න. (ල.30)

b. භූගත ජලය පුනරාරෝපණයට බලපාන සාධක විස්තර කරන්න. (ල.30)

c. භූගත ජල පුනරාරෝපණයේ වැදගත්කම පහදන්න. (ල.30)

03).a. ගව පාලනයේදී භාවිතා කරන සතුන් ඇති කරන ක්‍රම වන නිදැලි ක්‍රමය,අඩ සියුම් ක්‍රමය හා සියුම් ක්‍රමය යන ක්‍රම 03හි වාසි සහ අවාසි සන්සන්දනය කරන්න. (ල.30)

b. කිරි එකතු කිරීමේ මධ්‍යස්ථානයකදී 'Platform Test' පරීක්ෂාවන් කිරීමේ වැදගත්කම කෙටියෙන් පහදන්න. (ල.30)

c. බ්‍රොයිලර් මස් නිෂ්පාදන ක්‍රියාවලියේ පියවර ගැලීම් සටහනක් මගින් පහදන්න.

(ල.30)

04).a. ආහාර පරිරක්ෂණයේදී සුඛීකරණයේ හා බිලොන්චිකරණයේ වැදගත්කම විස්තර කරන්න.

(ල.30)

b. ආහාර සැකසීමේ නව ප්‍රවනතා 03ක් උදාහරණ සහිතව විස්තර කරන්න. (ල.30)

c. ආහාරයක ඉන්ද්‍රිය ගෝචරතාව ඇගයීමේ වැදගත්කම පහදන්න. (ල.30)

05. a. දැව පදම් කිරීමේ අවශ්‍යතාව පහදන්න. (ල.30)

b. දැව පදම් කිරීමේදී දැව පරිරක්ෂණය කිරීමේ වැදගත්කම පහදන්න. (ල.30)

c. පහත දැක්වෙන දැව පරිරක්ෂණ ක්‍රම 03 කෙටියෙන් විස්තර කරන්න.

01. බුරුසු වලින් ආලේප කිරීම.

02. උණුසුම් හා සිසිල් ක්‍රමය.

03. විසරණය. (ල.30)

06. a. වෘත්තීය ආපදා වර්ගීකරණය කර එක එකක් පිළිබඳව කෙටියෙන් නිදසුන් සහිතව විස්තර කරන්න. (ල.30)

b. වෘත්තීය ආපදා වැළැක්වීමේ වැදගත්කම පහදන්න. (ල.30)

c. මෑතකදී රබර් කර්මාන්ත ශාලාවක සිදු වූ වෘත්තීය ආපදාවක් හේතුවෙන් ජීවිතද අහිමිවිනි. අනාගතයේදී එවැනි ආපදාවක් වළක්වා ගැනීමට උපදෙස් ලබා දීමට ඔබට පැවරී ඇත්නම් ඔබ විසින් ලබාදෙන උපදෙස් සැකවින් පහදන්න. (ල.30)